" විශිෂ්ඨ රාජ්‍ය සේවාවක් සඳහා ඇප කැපවෙමු "

# ප්‍රධාන ලේකම් කාර්යාලය - බස්නාහිර පළාත
# பிரதான செயலாளர் அலுவலகம் - மேல் மாகாணம்
# OFFICE OF THE CHIEF SECRETARY - WESTERN PROVINCE

204, ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත, බත්තරමුල්ල.
204, டென்சில் கொப்பேகடுவ மாவத்தை, பத்தரமுல்ல.
204, Denzil Kobbekaduwa Mawatha, Battaramulla.

ප්‍රධාන ලේකම් / பிரதான செயலாளர் / Chief Secretary
දුරකථන / தொலைபேசி / Telephone - 011 - 2092599
ෆැක්ස් / பெக்ஸ் / Fax - 011 - 2092601
ඊ-මේල් / மின்னஞ்சல் / E-mail - chiefsecretary@wpc.gov.lk
පොදු දුරකථන / பொதுவான இலக்கம் / General Telephone 011 - 2093000

SLSI ISO 9001 SYSTEM CERTIFIED
SLAB ACCREDITED ISO/IEC: 17021 QMS-001-01

මගේ අංකය / எனது இலக்கம் / My No. CSWP/ADM/18-38/FI/01-2022 ඔබේ අංකය / உமது இலக்கம் / Your No. දිනය / திகதி / Date 2022.09.21

ආණ්ඩුකාර ලේකම්(බ.ප.),
ලේකම්,පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව (බ.ප.),
සභා ලේකම් (බ.ප.),
ලේකම්,(පළාත් පාලන/අධ්‍යාපන/කෘෂිකර්ම/ප්‍රවාහන/සෞඛ්‍ය) අමාත්‍යාංශය(බ.ප.),
නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (පාලන/පිරිස් හා පුහුණු/මූල්‍ය/සැලසුම්/ඉංජිනේරු),
පළාත් ආදායම් කොමසාරිස්(බ.ප.),
ප්‍රධාන නීති නිලධාරි,නීති ඒකකය (බ.ප.),
අධ්‍යක්ෂ,අභ්‍යන්තර විගණන ඒකකය (බ.ප.),
ප්‍රධාන ලේකම්ගේ සම්බන්ධීකරණ ලේකම්/පරිපාලන නිලධාරී,

**මධ්‍යම රජයේ විවිධ අමාත්‍යාංශ වෙතින් ලැබෙන චක්‍රලේඛ (මූල්‍ය චක්‍රලේඛ හැර) බස්නාහිර පළාතට අදාල කර ගැනීමේ කමිටු තීරණ සඳහා අනුමැතිය ලබා ගැනීම**

උක්ත කරුණට අදාලව පහත සඳහන් චක්‍රලේඛ බස්නාහිර පළාතට අදාල කර ගැනීම සඳහා ගරු ආණ්ඩුකාරතුමා විසින් අනුමැතිය ලබා දී ඇති බව ආණ්ඩුකාර ලේකම්ගේ අංක GOS/ADM/6/2/19 හා 2022.08.04,2022.09.06 දිනැති ලිපි මගින් මා වෙත දන්වා ඇත.

| | |
|---|---|
| 2022.08.12<br>රා.ප.ච.ලිපි 01/2022 | ආයතන සංග්‍රහයේ XII වැනි කාණ්ඩයේ XLVIII වැනි පරිච්ඡේදයේ 13:2, 21:2, 22:1:1 හා 14:12 උප වගන්ති සංශෝධනය කිරීම. |
| 2022.08.29<br>රා.ප.ච.ලිපි 02/2022 | රාජ්‍ය ආයතන වලට මහජනතාවගෙන් ලැබෙන ලිපි, විද්‍යුත් ලිපි (E-mail) සහ දුරකථන ඇමතුම් සඳහා පිළිතුරු සැපයීම. |
| 2022.08.29<br>රා.ප.ච.02/2021(VII) | COVID-19 වෛරසය මර්ධනය කිරීම සඳහා රජය අනුගමනය කළ ක්‍රමවේදයන් හා සමගාමීව 2020 මාර්තු 13 දිනෙන් පසු රාජ්‍ය නිලධරයන්ගේ නිවාඩු හා දීමනා සම්බන්ධව ගත යුතු ක්‍රියාමාර්ග. |
| 2022.06.24<br>රා.ප.ච. 16/2022(11) | රජයේ කාර්යාල වෙත නිලධරයන් කැඳවීම සීමා කිරීම |

02. එකී චක්‍රලේඛ පරිදි කටයුතු කරන ලෙස ඔබ යටතේ සිටින සියළුම දෙපාර්තමේන්තු ප්‍රධානීන්,ආයතන ප්‍රධානින් හා නිලධාරීන් දැනුවත් කරන ලෙසත් කාරුණිකව ඉල්ලා සිටිමි.

එස්.එම්.එච්.කුසුම්සිරි,
පරිපාලන නිලධාරී (පාලන),
ප්‍රධාන ලේකම් වෙනුවට,
බස්නාහිර පළාත.

රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ ලිපි: 01/2022

මගේ අංකය: EST-3/DICIP/06/0259
රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු,
පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය
නිදහස් චතුරශ්‍රය
කොළඹ 07.

2022.08. 12

අමාත්‍යාංශ ලේකම්වරුන්
පළාත් ප්‍රධාන ලේකම්වරුන්
දෙපාර්තමේන්තු ප්‍රධානීන්

**<u>ආයතන සංග්‍රහයේ II වැනි කාණ්ඩයේ XLVIII වැනි පරිච්ඡේදයේ 13:2, 21:2, 22:1:1 හා 14:12 උප වගන්ති සංශෝධනය කිරීම</u>**

උක්ත මැයෙන් 2019.09.30 දිනැතිව නිකුත් කළ රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 30/2019 කෙරෙහි ඔබගේ අවධානය යොමු කරවමි.

02. ඉහත චක්‍රලේඛයෙන් නියම කර ඇති විධිවිධානයන්ට අදාළව නියමිත කාලවකවානු තුළ බොහෝමයක් විනය පරීක්ෂණ නිම නොවන තත්ත්වයක් නිරීක්ෂණය වී ඇත. විධිමත් විනය පරීක්ෂණ පවත්වාගෙන යාමේ දී ගැටලු මතුවන්නේ නම් එසේ මතුවන ගැටලු සඳහා අවශ්‍ය පිළියම් යොදා ගනිමින්, පරීක්ෂණයේ චූදිත නිලධරයාට/නිලධරයන්ට මෙන්ම රජයටත් අගතියක් නොවන ආකාරයට විධිමත් විනය පරීක්ෂණ එකී චක්‍රලේඛයේ විධිවිධාන අනුව අවසන් කිරීම සඳහා අවශ්‍ය සියලු ක්‍රියාමාර්ග ගන්නා ලෙස මෙයින් දැනුම් දෙමි.

එම්.එම්.පී.කේ මායාදුන්නෙ
ලේකම්
රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු,
පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය